# <u>සියවස සපුරන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව</u>

## 1. හැඳින්වීම

**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වනාහි වෙස්ට්මිනිස්ටර් පාර්ලිමේන්තු ආකෘතිය අනුගමනය කරන කාරක සභාවකි. මෙය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවෙහි පැරණිතම හා වඩාත්ම සුවිශේෂී මූල්‍ය අධීක්ෂණ කාරක සභාවයි. ජනතා නියෝජිතයින් ගෙන් සැදුම්ලත් ආයතනය වශයෙන්, පාර්ලිමේන්තුවට රාජ්‍ය මුදල් සම්බන්ධ වගවීම සහතික කිරීමෙහිලා සහාය වීමෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව අධීක්ෂණ කාරක සභාවක් වශයෙන් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකරයි. විධායකයේ ආයතන විසින් රාජ්‍ය මුදල් භාවිත කිරීම පිළිබඳව අධීක්ෂණය කිරීමේ කාර්යය එයට පැවරී ඇත.

## 2. කාරක සභාවේ ඉතිහාසය

ගරු ඊ.ආර්. තම්බිමුත්තු මැතිතුමා විසින් ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවට 1921 ඔක්තෝබර් 05 වැනි දින ඉදිරිපත් කරන ලද යෝජනාවට ප්‍රතිචාර වශයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පිහිටුවන ලදී.

**ඉදිරිපත් කරන ලද යෝජනාව**

“ව්‍යවස්ථාදායක සභාව ඉදිරිපත් කළ වැය විෂයන් වෙනුවෙන් පරිපූරක ප්‍රදානයන්ද ඇතුළු එක් එක් මුදල් වර්ෂය සඳහා වූ මෙම සභාවේ ප්‍රදානයන් යොදවා ඇති දැයි පරීක්ෂා කර බැලීමේ කිසිදු ක්‍රමවේදයක් මෙම සභාවට නොමැති හෙයින්ද, වර්ෂය අවසානයේදී වියදම් නොකරන ලදුව ඉතිරිව ඇති ශේෂයන් පසු වර්ෂයෙහි වියදම් පියවීම සඳහා ලබා දෙනු නොලබන හෙයින්ද, මීළඟ මුදල් වර්ෂය, එනම් 1921–22 මුදල් වර්ෂය සඳහා රජයේ ගිණුම් පිළිබඳ ස්ථාවර කාරක සභාවක් පත්කරනු ලැබිය යුතුයැයි මම යෝජනා කරමි.” (සභාවාර වාර්තා, 1922)

ඒ අනුව, 1923 සැප්තැම්බර් 5 වැනි දින රජයේ ගිණුම් පිළිබඳ ස්ථාවර කාරක සභාවක් පත්කරන ලදී. එහි පළමු රැස්වීම 1923 ඔක්තෝබර් 17 වැනි දින පවත්වන ලදී. එම කාරක සභාව පහත සාමාජිකයන්ගෙන් සමන්විත විය.

සභාපති - ගරු ඊ. ජේ. හේවඩ් මහතා ( Hon.E.J.Hayward)

ගරු ඊ.ආර්. තම්බිමුත්තු මහතා ( Hon. E.R. Tambimuttu)

ගරු එෆ්.. ආර්. ඩයස් මහතා (Hon. F.R. Dias)

ගරු ඒ.සී.ජී. විජේකෝන් මහතා (Hon. A.C.G. Wijekoon)

එහිදී, 1921–22 වර්ෂය සඳහා යටත්විජිත විගණකවරයාගේ වාර්තාව පිළිබඳව විමසා බැලීම සිදු විය. මෙම තත්ත්වය 1931 වර්ෂයේ ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හඳුන්වා දෙන තෙක්ම පැවති අතර එය ක්‍රියාත්මක වූයේ යම් සීමාවන් ඇතිව ය. කෙසේ වුවද, කාරක සභාවේ ඉල්ලීම මත යටත් විජිත විගණකවරයා සියලුම රැස්වීම්වලට සහභාගි විය. 1931 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විගණන හෝ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවල කාර්යභාරය කෙරෙහි එතරම් අවධානයක් ලබා දුන්නේ නැත. කෙසේ වුවද, ඔවුහු විගණනයේ වගකීම සම්බන්ධයෙන් පුළුල් බලපෑමකින් යුක්ත වෙනස්කම් නිර්දේශ කළහ. ඒ අනුව, පළමු වරට විගණකාධිපතිවරයා ව්‍යවස්ථාදායකයට සෘජුවම වගකිවයුතු තත්ත්වයට පත් කරන ලදී.

ඉන්පසුව මෙම කාරක සභාව 1932 ජූනි 21 වැනි දිනැති රාජ්‍ය මන්ත්‍රණ සභාවේ යෝජනා-සම්මතයක් මගින් පත්කරනු ලැබූ අතර රජයේ ගිණුම් පිළිබඳ ස්ථාවර කාරක සභාවක් සඳහා විධිවිධාන සලස්වනු පිණිස රාජ්‍ය මන්ත්‍රණ සභාවේ රීති හා නියෝග සංශෝධනය කරන ලදී.

මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව මුදල් ලේකම් විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාවේ යෙදවීමට යෝජනා කරන ලදුව එකඟත්වය පළ විය. කාරක සභාවේ ඉල්ලීම පරිදි විගණකාධිපතිවරයා සහ මහා භාණ්ඩාගාර නියෝජිතයෙක් කාරක සභාවේ රැස්වීම්වලට සහභාගී වූහ.

මෙම කාලපරිච්ඡේදය තුළ මතු වූ තවත් වැදගත් කාරණයක් වූයේ රාජ්‍ය මන්ත්‍රණ සභාව රජයේ ගිණුම් පිළිබඳ ස්ථාවර කාරක සභාවේ වාර්තාව පිළිබඳව සභාව තුළදී සලකා බැලිය යුතු බවත් ය.

1947 සෝල්බරි පාලන ක්‍රමය තුළ, මුදල් පිළිබඳ පාලනය පාර්ලිමේන්තුවේ ඇස්තමේන්තු සම්මත කිරීමෙන් අවසන් නොවී, විසර්ජන පනත බලාත්මක කිරීමෙන් පසු යම් සේවාවක් සඳහා අනුමත කරන මුදල් නිසි ලෙස වියදම් කර තිබේද යන්න පරීක්ෂා කිරීමේ වැදගත්කම විගණකාධිපති විෂය පථයට අයත් විය යුතු බව මෙහිදී මතු වූ වැදගත් කරුණකි.

ශ්‍රී ලංකාවට නිදහස ප්‍රදානය කිරීමෙන් පසුව රාජ්‍ය ආදායම හා වියදම වර්ධනය වීම හේතුවෙන් නිසි වගවීම සාක්ෂාත් කර ගනු පිණිස එය වඩාත් සුපරීක්ෂාකාරී ලෙස පිරික්සීම අවශ්‍ය විය.

1948 වර්ෂයේ නිදහස් ශ්‍රී ලංකාව බිහිවීමත් සමගම පාර්ලිමේන්තුවේ **ස්ථාවර නියෝග අංක 125** යටතේ පූර්ණ බලතල සහිත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවක් පිහිටුවනු ලැබීය.

වසර ගණනක් මුළුල්ලේ, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කාර්ය සම්භාරය වැඩි වෙමින් පැවතීම හේතුවෙන් රාජ්‍ය ව්‍යවසාය (පොදු ව්‍යාපාර) ආශ්‍රිත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිමය කාරණාවන් එම කාරක සභාවෙන් වෙන් කිරීම අවශ්‍ය විය. වෙනම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවක් පිහිටුවීම සඳහා පාර්ලිමේන්තුව විසින් 1979 මාර්තු 23 වැනි දින ස්ථාවර නියෝග අංක 126 පනවන ලදී. 2022 ඔක්තෝබර් 05 දින සහ 2022 නොවැම්බර් 23 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද සංශෝධන ද අන්තර්ගත 2022 නොවැම්බර් 23 දින සිට බලාත්මක නව ස්ථාවර නියෝගයන්හි ස්ථාවර නියෝග අංක 119 රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පිහිටුවීම හා එහි බලතල හා කර්තව්‍යයන් සම්බන්ධයෙන් විධිවිධාන සලස්වයි.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මූලිකවම ස්ථාවර නියෝග අංක 119 මගින් ද ඊට අමතරව ස්ථාවර නියෝග අංක 134 හා 135 මගින් ද බලාත්මක වන අතර එමගින් කාරක සභාවෙහි නිසි ක්‍රියාකාරීත්වය හා සම්බන්ධ කරුණු පිළිබඳව විධිවිධාන සලසයි.

# 3. රාජ්‍ය මුදල් ආශ්‍රිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන**

ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය මුදල් සම්බන්ධයෙන් පූර්ණ බලතල පැවරී ඇත්තේ පාර්ලිමේන්තුවටය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව පහත පරිදි විධිවිධාන සලස්වයි:

> “රාජ්‍ය මුදල් පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වන්නේය. පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද නීතියක හෝ පවත්නා යම් නීතියක අධිකාරය අනුව හෝ ඒ යටතේ හෝ මිස කිසිම පළාත් පාලන ආයතනයක් විසින් හෝ වෙනත් පොදු අධිකාරයක් විසින් හෝ කිසිම බද්දක්, වරිපනමක් හෝ වෙනත් යම්කිසි බදු විශේෂයක් නියම කිරීමට බලය නොමැත්තේය.”

ඒකාබද්ධ අරමුදල සම්බන්ධයෙන් වන 149 ව්‍යවස්ථාව හා 150 ව්‍යවස්ථාව සහ අවිනිශ්චිත අවස්ථා අරමුදල සම්බන්ධයෙන් වන 151 ව්‍යවස්ථාව රාජ්‍ය මුදල් පිළිබඳව පාර්ලිමේන්තුවේ අනන්‍ය පාලනය පෙන්වයි.

## 4.රාජ්‍ය මුදල් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

පාර්ලිමේන්තුව අදියර තුනකින් රාජ්‍ය මුදල් පිළිබඳ සිය පාලනය ක්‍රියාවේ යොදවයි.

- ආදායම් හා වියදම් ඇස්තමේන්තු සමාලෝචනය කොට අනුමත කිරීම
- අයවැය ක්‍රියාත්මක කෙරෙන ආකාරය සමාලෝචනය හා නිරීක්ෂණය කිරීම
- රජයේ හා එහි ආයතනයන්හි වගවීම සමාලෝචනය හා විමර්ශනය කිරීම

පාර්ලිමේන්තුව විසින් ඉහත කාර්යයන් මට්ටම් දෙකකදී ක්‍රියාවේ යොදවනු ලැබේ.

- පූර්ණ සභාව මට්ටමින්
- එහි කාරක සභා මට්ටමින්

**කාරක සභා මට්ටම**

මෙම මට්ටමේදී පාර්ලිමේන්තුව සිය මූල්‍ය අධීක්ෂණ කාරක සභා හරහා ගැඹුරු ලෙස විමර්ශනය කිරීමේ වරප්‍රසාදය ලබයි.

ඒ අනුව, රාජ්‍ය මූල්‍ය පාලනයට සහාය වෙමින් මූල්‍ය අධීක්ෂණ කාර්යය රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මගින් ප්‍රධාන වශයෙන් ඉටු කරනු ලබයි.

රාජ්‍ය මූල්‍ය පාලනයෙහිලා මෙම අධීක්ෂණ කාරක සභාවල දායකත්වය අතිශයින් වැදගත් වේ.

## 5.රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව

- **රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙහි කර්තව්‍ය**

මහජන වියදම් සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රදානය කරනු ලබන මුදල් විසර්ජනය කිරීම පෙන්නුම් කරන ගිණුම්ද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලැබිය හැකි පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන වෙනත් යම් ගිණුම්ද විගණකාධිපතිවරයාගේ සහය ඇතිව පරීක්ෂා කරනු ලැබීම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කාර්යය විය යුත්තේ ය. – [ ස්ථාවර නියෝග 119 (2)]

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සෑම මාස තුනකට වරක්, පරික්ෂා කරන ලද ගිණුම් , මූල්‍ය, මූල්‍ය කාර්ය පටිපාටි, හා යම් දෙපාර්තමේන්තුවක, පළාත් පාලන ආයතනයක කාර්ය සාධනය හා සාමාන්‍ය කළමනාකරණය ගැනද ඉන් පැන නගින යම් කාරණයක් සම්බන්ධයෙන් ද පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේය. රාජ්‍ය මූල්‍ය නිසි පරිදි පරිහරණය කිරීම සහතික කරලනු වස්, ඊට අදාළ කාරණාවලට විසඳුම් සැපයෙන ක්‍රියාමාර්ග පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ මෙම වාර්තාවට අඩංගු විය යුත්තේය. – [ ස්ථාවර නියෝග 119 (3)]

➢ **1923 සිට 1947 දක්වා කාලය තුළ පහත නම් සඳහන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිත්වය දරා ඇත.**

- ගරු ඊ.ජේ. හේවඩ් මහතා
- ගරු එච්.ඒ. ලූස් මහතා
- ගරු කේ.පී. බාලසිංහම් මහතා
- ගරු හෙන්රි එල්. ද මෙල් මහතා
- ගරු බී.එච්. අළුවිහාරේ මහතා
- ගරු ඩඩ්ලි සේනානායක මහතා
- ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
- ගරු එච්.ඩබ්ලිව්. අමරසූරිය මහතා

- ගරු ජේ. ත්‍යාගරාජා මහතා

➢ **1947 සිට මේ දක්වා පහත නම් සඳහන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිත්වය දරා ඇත.**

- ගරු කේ. කණගරත්නම් මහතා, පා.ම. (1947 – 1950)
- ගරු ඇල්බට් එෆ්. පීරිස් මහතා, පා.ම. (1950 – 1951)
- ගරු රොසලින් කොච් මහතා, පා.ම. (1951 – 1959)
- ගරු ආර්.එස්.වී. පෝලියර් මහතා, සී.බී.ඊ., පා.ම. (1960 – 1962)
- ගරු වී.ඒ. කන්දයියා මහතා, පා.ම. (1962 – 1963)
- ගරු ආර්.එස්.වී. පෝලියර් මහතා, සී.බී.ඊ., පා.ම. (1963 – 1964)
- ගරු බර්නාඩ් සොයිසා මහතා, පා.ම. (1965 – 1976)
- ගරු එස්. තොණ්ඩමාන් මහතා, පා.ම. (1976 – 1978 මාර්තු)
- ගරු පී.එස්. සුසෙදාසන් මහතා, පා.ම. (1978 නොවැම්බර් - 1983 ජනවාරි)
- ගරු ඩබ්ලිව්.පී.බී. දිසානායක මහතා, පා.ම. (1983 පෙබරවාරි – 1987)
- ගරු පී.වී.එස්. ද සිල්වා මහතා, පා.ම. (1988)
- ගරු චන්ද්‍ර කුමාර විජයගුණවර්ධන මහතා, පා.ම. (1989)
- ගරු ඊ.පී. පෝල් පෙරේරා මහතා, පා.ම. (1990 – 1994)
- ගරු (ආචාර්ය) පී.බී.ජී. කළුගල්ල මහතා, පා.ම. (1994 – 1995)
- ගරු (මහාචාර්ය) ඩබ්ලිව්.ඒ. විශ්වා වර්ණපාල මහතා, පා.ම. (1996 – 2000 අගෝස්තු)
- ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා, පා.ම. (2000 නොවැම්බර් - 2001 ජූලි)
- ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා, පා.ම. (2002 ජනවාරි – 2004 පෙබරවාරි)
- ගරු රවුෆ් හකීම් මහතා, පා.ම. (2004 මැයි – 2008 අප්‍රේල්)
- ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා, පා.ම. (2008 ජූනි – 2010 ජනවාරි)
- ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා, පා.ම. (2010 මැයි - 2015 ජූනි)
- ගරු ලසන්ත අලගියවන්න මහතා, පා.ම. (2015 නොවැම්බර් – 2020 පෙබරවාරි)
- ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා, පා.ම. (2020 සැප්තැම්බර් - 2022 ජූලි)
- ගරු කබීර් හෂීම් මහතා, පා.ම. (2022 ඔක්තෝබර් - 2023 ජනවාරි)
- ගරු ලසන්ත අලගියවන්න මහතා, පා.ම. (2023 පෙබරවාරි සිට)

**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙහි සංයුතිය**

**ස්ථාවර නියෝග 119 (1) - තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් නොවන සාමාජික මන්ත්‍රීවරයන් දහසය දෙනෙකුගෙන් සමන්විත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.**

පවත්නා පාර්ලිමේන්තුවේ පක්ෂ අනුපාතයට අනුව තේරීම් කාරක සභාව මගින් සාමාජිකයන් පත් කෙරෙන අතර සෑම පාර්ලිමේන්තු සභාවාරයක් ආරම්භයේදීම ගරු කථානායකතුමා විසින් ඒ බව නිවේදනය කරනු ලැබේ.

පක්ෂ නායකවරුන්ගේ ඉල්ලීම පරිදි සභාවාරයෙන් සභාවාරයට තේරීම් කාරක සභාව විසින් ගනු ලබන තීරණය පරිදි මෙම සංඛ්‍යාව වෙනස් වේ.

**9 වැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය**

වර්තමානයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාමාජික සංඛ්‍යාව 31 වන අතර එම සාමාජික ලේඛනය පහතින් දැක්වේ:-

- ගරු ලසන්ත අලගියවන්න මහතා (සභාපති)
- ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
- ගරු ප්‍රසන්න රණවීර මහතා
- ගරු කේ. කාදර් මස්තාන් මහතා
- ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
- ගරු ඩයනා ගමගේ මහත්මිය
- ගරු චාමර සම්පත් දසනායක මහතා
- ගරු එස්. බී. දිසානායක මහතා
- ගරු තිස්ස අත්තනායක මහතා
- ගරු වජිර අබේවර්ධන මහතා
- ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා
- ගරු කබීර් හෂීම් මහතා
- ගරු මනෝ ගනේෂන් මහතා
- ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
- ගරු විමලවීර දිසානායක මහතා
- ගරු නිරෝෂන් පෙරේරා මහතා
- ගරු ජේ. සී. අලවතුවල මහතා
- ගරු වඩිවේල් සුරේෂ් මහතා
- ගරු අශෝක් අබේසිංහ මහතා
- ගරු බුද්ධික පතිරණ මහතා
- ගරු ජයන්ත කැටගොඩ මහතා
- ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
- ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
- ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා
- ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
- ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය
- ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා
- ගරු ඩී. වීරසිංහ මහතා
- ගරු වීරසුමන වීරසිංහ මහතා
- ගරු මංජුලා දිසානායක මහත්මිය
- ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

## 6. විගණකාධිපතිවරයා හා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව

විගණකාධිපතිවරයා පත් කිරීම පිළිබඳ විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වැනි ව්‍යවස්ථාවෙහි දක්වා ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154 වැනි ව්‍යවස්ථාවෙහි විගණකාධිපතිවරයාගේ කාර්‍ය හා කර්තව්‍ය දක්වා තිබේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනත මගින් විගණකාධිපතිවරයා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කටයුතු වලට සහාය විය යුතු බව දක්වා ඇත.

විගණකාධිපතිවරයා සෑම මූල්‍ය වර්ෂයක් අවසාන වී මාස 10ක් ඇතුළත හා ඔහුට අවශ්‍යය යැයි හැඟෙන අවස්ථාවන්හිදී , රජයේ ආයතනයන්හි ගිණුම් ආශ්‍රය කොටගෙන, සිය ගිණුම් වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබයි.

කාරක සභාවෙහි විමර්ශන කටයුතු සඳහා පදනම සපයන්නේ රාජ්‍ය ආයතන විගණනය කර විගණකාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන මෙම වාර්තාවන් ය. කෙසේ වෙතත්, විගණකාධිපතිවරයා ගේ වාර්තාවන් හි අඩංගු නොවන නමුත් රාජ්‍ය මූල්‍ය හා සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට කාරක සභාවට කිසිදු බාධාවක් නොමැත.

රාජ්‍ය ආයතනවල අඩුපාඩු ලෙස විගණකාධිපතිවරයා විසින් යොමු කරනු ලැබ ඇති ගැටළු පහත සඳහන් පුළුල් කාණ්ඩවලට අයත් වන බව විගණකාධිපතිවරයාගේ වාර්තා සියුම් ලෙස පරීක්ෂා කර බැලූ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව නිරීක්ෂණය කළේය:

1. විසර්ජන නීති, මුදල් රෙගුලාසි සහ අනෙකුත් නියමයන්, භාණ්ඩාගාර චක්‍රලේඛ සහ දෙපාර්තමේන්තුමය ස්ථාවර නියෝග ආදියට අනුකූලව කටයුතු නොකිරීම.
2. වැය කරනු ලබන සම්පත් වලට අදාළව ලබා ගන්නා ප්‍රතිපල සමපාතික නොවීම
3. ආයතන පිහිටුවීමේදී එම ආයතන සඳහා නියම කර ගත් අරමුණු ඉටු කර නොගැනීම සහ එම ආයතන වලට පවරා ඇති ප්‍රධාන කර්තව්‍යයන් ඉටු නොකිරීම.
4. රජයට පාඩු සිදුවීම, ආර්ථික නොවන ගනුදෙනු, රාජ්‍ය වත්කම් අයථා පරිහරණය සහ වංචා.

## 7.රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ස්ථාපනය කළ යුතු මූලික කරුණු.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ස්වකීය කර්තව්‍යයන් ඉටු කිරීමේදී අවධානයට ගත යුතු මූලික කරුණු තුනක් තිබේ:

1. පාර්ලිමේන්තුව විසින් අපේක්ෂා කරනු ලබන පරිදි මුදල් වියදම් කරනු ලබන බව;
2. රාජ්‍ය මුදල් වියදම් කිරිමේදී අනාර්ථික ගනුදෙනු සිදු නොවන බව; සහ
3. මූල්‍ය ගනුදෙනු හා කාර්ය සාධන කාර්යන්හිදී රාජ්‍ය සදාචාරයේ ඉහළ ප්‍රමිතීන් පවත්වා ගෙන යනු ලබන බව.

පාර්ලිමේන්තුව විසින් පනවනු ලැබ ඇති නීති, නියමයන්, අනෙකුත් විධි විධානයන් සහ පරිචයන්ට අනුකූල වෙමින් මුදල් වියදම් කර තිබේද යන්න කාරක සභාව විසින් නිශ්චය කර ගනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා විමර්ශනයන්හිදී පහත ප්‍රධාන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරනු ලබයි.**

- වැඩසටහන් හා ව්‍යාපෘතීන් වල අතිරික්තයන්
- අත්තිකාරම් ගිණුම් සීමා සමග අනුකූල නොවීම
- අනවසර කාරක අලාභ
- නීති, රෙගුලාසි හා ව්‍යවස්ථාවන් ආදියට අනුකූල නොවීම පිළිබඳ විගණන නිරීක්ෂණ.
- වැය කරන මුදලට ලද වටිනාකම පිළිබඳ විගණනය

## 8.රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙහි අධීක්ෂණය යටතට ගැනෙන ආයතන

ආසන්න වශයෙන් රාජ්‍ය ආයතන **835** ක් මෙම කාරක සභාවෙහි අධීක්ෂණය යටතේ පවතී. (2023 අය වැය ඇස්තමේන්තු අනුව)

| | |
|---|---|
| විශේෂිත වියදම් ඒකක | 19 |
| අමාත්‍යාංශ | 29 |
| දෙපාර්තමේන්තු | 102 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල | 25 |
| **පළාත් සභා ආයතන** | |
| පළාත් සභා අරමුදල් | 9 |
| විශේෂිත වියදම් ඒකක, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පළාත් සභා යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතන | 310 |
| **පළාත් පාලන ආයතන** | |
| මහනගර සභා | 24 |
| නගර සභා | 41 |
| ප්‍රාදේශීය සභා | 276 |
| **එකතුව** | 835 |

**පළමුවැනි පාර්ලිමේන්තුවේ සිට මේ දක්වා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් විමර්ශනය කළ ආයතන සංඛ්‍යාව හා ඉදිරිපත් කරන ලද වාර්තා පිළිබඳ තොරතුරු පහතින් දක්වා ඇත:**

## ආයතන විමර්ශනය කිරීම් හා කාරක සභා වාර්තා සභාගත කිරීම (1978 – 2023)

| පාර්ලිමේන්තුව | සභා වාරය | සභාපතිවරයාගේ නම | විමර්ශනය කරන ලද ආයතන සංඛ්‍යාව | ඉදිරිපත් කළ වාර්තා ගණන |
|---|---|---|---|---|
| පළමුවැනි පාර්ලිමේන්තුව | පළමුවැනි හා දෙවැනි සභා වාරය | ගරු. පී.එස්. සුසෙයිදාසන් මහතා (1978.09.07 සිට 1983.01.07 දක්වා) | 102 | 08 |
| | තෙවැනි සභා වාරය සිට හත්වැනි සභා වාරය දක්වා | ගරු. ඩබ්ලිව්.පී.බී. දිසානායක මහතා (1983.02.09 සිට 1988.01.22 දක්වා) | 76 | 06 |
| | අටවැනි සභා වාරය | ගරු චන්ද්‍රකුමාර විජය ගුණවර්ධන මහතා (1988.02.25 සිට 1988.12.20 දක්වා) | 20 | 01 |
| මුළු එකතුව | | | 198 | 15 |
| දෙවැනි පාර්ලිමේන්තුව | පළමුවැනි සභා වාරයේ සිට පස්වැනි සභා වාරය දක්වා | ගරු. ඊ.පී. පෝල් පෙරේරා මහතා (1989.03.09 සිට 1994.06.24 දක්වා) | 47 | 11 |
| **මුළු එකතුව** | | | **47** | **11** |
| තෙවැනි පාර්ලිමේන්තුව | පළමුවැනි හා දෙවැනි සභා වාරයන් | ගරු. (ආචාර්ය) පී.බී.ජී. කළුගල්ල මහතා (1994.08.25 සිට 1996.01.12 දක්වා) | ආයතන විමර්ශනයක් නොව පොදු කරුණු සම්බන්ධයෙනි. | 02 |
| | තෙවැනි සභා වාරය | ගරු. (ආචාර්ය) විශ්වා වර්ණපාල මහතා (1996.02.09 සිට 2000.08.18 දක්වා) | ආයතන විමර්ශනයක් නොව පොදු කරුණු සම්බන්ධයෙනි. | 03 |
| මුළු එකතුව | | | | 05 |
| සිව්වැනි පාර්ලිමේන්තුව | දෙවැනි සභා වාරය | ගරු. මහින්දානන්ද අලුත්ගමගේ මහතා 2000.11.09 සිට 2001.10.27 දක්වා) | - | - |
| **මුළු එකතුව** | | | - | - |
| **පාර්ලිමේන්තුව** | **සභා වාරය** | **සභාපතිවරයාගේ නම** | **විමර්ශනය කරන ලද ආයතන සංඛ්‍යාව** | **ඉදිරිපත් කළ වාර්තා ගණන** |

| | | | | |
|---|---|---|---|---|
| පස්වැනි පාර්ලිමේන්තුව | පළමුවැනි හා දෙවැනි සභා වාරය | ගරු. අනුර ප්‍රියදර්ශන යාපා මහතා (2001.12.19 සිට 2004.02.07 දක්වා) | 01 | 01 |
| **මුළු එකතුව** | | | 01 | 01 |
| හය වැනි පාර්ලිමේන්තුව | පළමුවැනි හා දෙවැනි සභා වාරය | ගරු. රවුෆ් හකීම් මහතා (2004.04.22 සිට 2008.05.06 දක්වා) | විශේෂ වාර්තාවකි | 01 |
| | තෙවැනි හා සිව්වන | ගරු. අනුර ප්‍රියදර්ශන යාපා මහතා (2008.06.05 සිට 2010.02.09 දක්වා) | - | - |
| **මුළු එකතුව** | | | | 01 |
| හත් වැනි පාර්ලිමේන්තුව | පළමු සැසිවාරය | ගරු. (ආචාර්ය) සරත් අමුණුගම මහතා (2010.04.22 සිට 2015.06.26 දක්වා) | 160 | 03 |
| **මුළු එකතුව** | | | 160 | 03 |
| අට වැනි පාර්ලිමේන්තුව | පළමු සැසිවාරය | ගරු. ලසන්ත අලගියවන්න මහතා (2015.09.01 සිට 2018.04.12 දක්වා) | 113 | 04 |
| | තෙවැනි සැසිවාරය | ගරු. ලසන්ත අලගියවන්න මහතා (2018.11.14 සිට 2019.12.02 දක්වා) | 50 | 02 |
| | සිව් වැනි සැසිවාරය | ගරු. ලසන්ත අලගියවන්න මහතා (2020.01.03 සිට 2020.03.02 දක්වා) | 42 | 01 |
| **මුළු එකතුව** | | | 205 | 07 |
| **පාර්ලිමේන්තුව** | **සභා වාරය** | **සභාපතිවරයාගේ නම** | **විමර්ශනය කරන ලද ආයතන සංඛ්‍යාව** | **ඉදිරිපත් කළ වාර්තා ගණන** |
| නව වැනි පාර්ලිමේන්තුව | පළමුවැනි සභා වාරය | ගරු. (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා (2020.08.20 සිට 2021.12.12 දක්වා) | 24 | 02 |
| | දෙවැනි සභා වාරය | ගරු. (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා | 8 | 01 |

| | | | | |
|---|---|---|---|---|
| | | (2022.01.18 සිට 2022.07.28 දක්වා) | | |
| | තෙවැනි සභා වාරය | ගරු. කබීර් හෂීම් මහතා (2022.08.03 සිට 2023.01.27 දක්වා) | 15 | 02 |
| | සිව්වැනි සභා වාරය | ගරු. ලසන්ත අලගියවන්න මහතා (2023.02.08 සිට මේ දක්වා) | 43 (විශේෂ විගණන වාර්තා 07 ක් ද ඇතුළුව) | 01 |
| **මුළු එකතුව** | | | 90 | 06 |

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව - තොරතුරු කළමනාකරණ පද්ධතිය ඇසුරින් කරන ලද රාජ්‍ය ආයතන ඇගයීම සම්බන්ධයෙන්

## ඉදිරිපත් කරන ලද වාර්තා

| පාර්ලිමේන්තුව | සභා වාරය | සභාපතිවරයාගේ නම | මුදල් වර්ෂය හා නිකුත් කළ දිනය | ඇගයීමට ලක් කරන ලද ආයතන සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අට වැනි පාර්ලිමේන්තුව | පළමු වැනි සැසිවාරය | ගරු ලසන්ත අලගියවන්න මහතා | 2015 2017.11.13 | 831 |
| | දෙවැනි සැසිවාරය | ගරු ලසන්ත අලගියවන්න මහතා | 2016 2018.06.19 | 837 |
| | තෙවැනි සැසිවාරය | ගරු ලසන්ත අලගියවන්න මහතා | 2017 2019.06.21 | 838 |
| | සිව්වැනි සැරසිවාරය | ගරු ලසන්ත අලගියවන්න මහතා | 2018 2020.02.18 | 844 |
| නව වැනි පාර්ලිමේන්තුව | පළමු වැනි සැසිවාරය | ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා | 2019 2021.10.07 | 833 |
| | දෙවැනි සැසිවාරය | ගරු කබීර් හෂීම් මහතා | 2020 2022.12.05 | 827 |

ඉහත වගුව අධ්‍යයනයෙන් වාර්ෂිකව කාරක සභාව ඉදිරියට කැඳවා විමර්ශනය කළ හැක්කේ ඉතාමත් සීමිත ආයතන සංඛ්‍යාවක් බව පැහැදිලි වේ.

ආයතන 835ක් පමණ වන සංඛ්‍යාවක් කාරක සභාව හමුවට කැඳවීම අපහසු කාර්යයක් බැවින්, මෙම අභියෝග තරමක් දුරට හෝ මැඩ පවත්වා ගැනීමේ අරමුණ ඇතිව අටවැනි පාර්ලිමේන්තුවේ පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2015 මූල්‍ය වර්ෂයේ සිට සියලු රාජ්‍ය ආයතන ඇතුළත් වන පරිදි එම රාජ්‍ය ආයතනවල මූල්‍ය විනය, මූල්‍ය නීති රීති හා රෙගුලාසි හා කාර්යසාධන මාර්ගෝපදේශයන්ට අනුගතවීම පිළිබඳව ඇගයීම සඳහා මාර්ගගත ප්‍රශ්නාවලින් උපයෝගී කර ගනිමින් ඇගයීම් ක්‍රමයක් ආරම්භ කරන ලදී. (දැනට පවත්නා කාරක සභාවට කැඳවීමේ ක්‍රමවේදයට අමතරව) .

# 9.රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය

රාජ්‍ය ආයතන සංඛ්‍යාව ඉහළ යාමත් සමග පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර කාරක සභාවේ විශේෂ අවධානය යොමු කරමින් වහා ජයගත යුතුව ඇති අභියෝග ලෙස 8 වැනි පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් හඳුනා ගන්නා ලදී.

- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ආවරණය කළ යුතුව ඇති අති විශාල ආයතන සංඛ්‍යාව (ආයතන 835 ක් පමණ)
- විගණකාධිපතිවරයාගේ වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී ඇතිවන ප්‍රමාදයන් සහ එම වාර්තා කාරක සභාව වෙත ලැබීමේදී ඇති වන ප්‍රමාදයන්. මෙම ප්‍රමාදයන් හේතුවෙන් සමහර ආයතනවල විගණනය සිදු කර සැලකිය යුතු කාලයක් ගතවීමෙන් පසුව කාරක සභාවට ඒ සම්බන්ධ පරීක්ෂණ පැවැත්වීමට සිදු වීම (කාලීන නොවන විගණනවීම වාර්තා විමර්ශනය කිරීමට සිදු වීම )
- පසුවිපරම් ක්‍රියාමාර්ග ගැනීම දුර්වල වීම සහ අදාළ ආයතන වලින් පිළිතුරු ලැබීමට ප්‍රමාද වීම.

**මාර්ගගත ඇගයීම් ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේදී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් අනුගමනය කරනු ලබන ක්‍රමෝපායයන්**

- රාජ්‍ය ආයතනවල ක්‍රියාත්මක වන ගිණුම්කරණ සහ පරිපාලන ක්‍රමවේද සහ කාර්ය පටිපාටි, එම ආයතනවලට අදාළ වන වාර්තාකරණ ක්‍රමවේදවල ස්වභාවය මෙන්ම එම ආයතනවලට වෙන්කර ඇති අයවැය ප්‍රතිපාදන ද සැලකිල්ලට ගනිමින් සියලුම රාජ්‍ය ආයතන කාණ්ඩ අටකට වෙන් කර ඇත.
- සියලුම පාර්ශ්වකරුවන් අතර සන්නිවේදන මාර්ගයක් ස්ථාපිත කර ඇති අතර, වැඩසටහන මෙහෙයවන විෂය භාර නිලධාරීන්, ගණන් දීමේ නිලධාරීන්, ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්, විගණකාධිපතිවරයා සහ පාර්ලිමේන්තුව අතර මාර්ගගත සම්බන්ධතාවක් ගොඩ නගා ඇත.
- එක් එක් ආයතන කාණ්ඩ සඳහා මාර්ගගත ප්‍රශ්නාවලි ආකෘති හයක් සකස් කර, සෑම රාජ්‍ය ආයතනයකටම එම ප්‍රශ්නාවලි බාගත කර ගෙන මාර්ගගතව සම්පූර්ණ කිරීමට හැකි වන පරිදි එම ප්‍රශ්නාවලි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ තොරතුරු කළමනාකරණ පද්ධතියට උඩුගත කර තිබේ.
- ප්‍රශ්නාවලිය කොටස් 2කින් සමන්විත අතර පහත සඳහන් දිශානති ඔස්සේ ඇගයීම් සිදු කිරීමට එම ප්‍රශ්නාවලීන් සකස් කර ඇත:

  **I කොටස – මූල්‍ය අනුකූලතාව (Financial Compliance)**

  i. කාර්ය සාධනය සහ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම
  ii. මූල්‍ය පාලනය සඳහා ආයතන විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
  iii. වත්කම් කළමනාකරණය
  iv. වාර්තා පවත්වා ගෙන යාම සහ මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම
  v. ආදායම් කළමනාකරණය (ආදායම් එකතු කිරීම හා ගිණුම්කරණය)
  vi. වියදම් පාලනය (පාර්ලිමේන්තුව විසින් පනවනු ලැබූ සීමාවන්ට අනුගතව, ප්‍රතිපාදන සහ අක්මුදල් උපරිම උපයෝජන සීමාවන්ට යටත්ව ක්‍රියා කිරීම)
  vii. අනෙකුත් මූල්‍ය ක්‍රියාකාරකම් (අත්තිකාරම් ගිණුම, වාණිජ කටයුතු සහ තැන්පත් ගිණුම්)
  viii. වාර්තා පවත්වා ගෙන යාම (ආයතනික සංස්ථාපන ලේඛන)
  ix. වාර්තා නියමිත වේලාවට ඉදිරිපත් කිරීම (ප්‍රධාන ගිණුම් අට)
  x. විගණන සඳහා ප්‍රතිචාර (විගණන විමසුම් සහ අභ්‍යන්තර විගණන විමසුම්)

xi. පාර්ලිමේන්තුවට කරුණු වාර්තා කිරීම (කාර්යසාධන වාර්තා ඉදිරිපත් කිරීම)

**II කොටස - මෙහෙයුම් කාර්යසාධනය (Operational Performance)**

i) තොරතුරු දැනගැනීමේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම

ii) සහශ්‍රක සංවර්ධනය සඳහා තිරසර සංවර්ධන අභිමතාර්ථ සපුරා ගැනීම

iii) පුරවැසි ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම

iv) නිසි මානව සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම

v) නව විගණන පනතට අනුකූලව ලබා ගන්නා විගණන මතය පිළිබඳ සැලකිල්ලට ගැනීම

vi) පාර්ලිමේන්තුවට වාර්තා කෙරෙන විගණන අනාවරණ පිළිබඳ නිසි ප්‍රතිචාර දැක්වීම

vii) එක් එක් ආයතනවල හඳුනාගත් අරමුණු හා කාර්යයන්ට අනුව කාර්යසාධන ඉලක්ක සපුරා ගැනීම.

- ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් යොමු කළ දත්ත විගණකාධිපතිවරයා විසින් පරීක්ෂාවට ලක් කර ලබා ගත් දත්ත අලුතින් ලබා ගත් ලකුණු ද සමඟ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කෙරේ.

- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පරිගණක තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් විවිධ ආයතන සඳහා ස්වයංක්‍රීයව ගණනය වූ ලකුණු සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා කාර්යාංශය මගින් සකස් කරන ලද විශ්ලේෂණාත්මක තොරතුරු ද ඇතුළත්ව සකසන ලද වාර්තාවක් වාර්ෂිකව පාර්ලිමේන්තුව හමුවේ සභාගත කරනු ලැබේ.

- හුදෙක් කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීමෙන් ඔබ්බට යමින් ඉහළ කාර්ය සාධනයක් පෙන්වූ රාජ්‍ය ආයතන අභිප්‍රේරණය වන පරිදි 2015,2016, 2017, 2018, 2019 සහ 2020 මුදල් වර්ෂවල දී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ඇගයීමට ලක් කර ඇත.

# 10.අටවැනි පාර්ලිමේන්තු කාලසීමාවේ සිට මේ දක්වා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව අත්කරගත් සුවිශේෂී ජයග්‍රහණ හා එහි ක්‍රියාකාරකම්

- ආයතනික කටයුතු විමසා බැලීම, කාරක සභා පැවැත්වීම, කාර්යසටහන් හා වාර්තා සැකසීම සහ පාර්ලිමේන්තුවට වාර්තා ඉදිරිපත් කිරීම යනාදී රාජ්‍ය ආයතන විමර්ශනයට ලක් කිරීම සඳහා සිය විෂය පථයට යටත්ව අනුගමනය කරන සාම්ප්‍රදායික ක්‍රමවේදවලට අමතරව 2015 සිට 2020 දක්වා වූ මුදල් වර්ෂවලට අදාළව වසර හයක මාර්ගගත ඇගයුම් සිදු කර එම වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති අතර 2021 වර්ෂයේ ඇගයීම් වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ අවසන් අදියරේ පවතී.

- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කළමනාකරණ තොරතුරු පද්ධති වාර්තා ද ඇතුළත්ව වාර්තා 19 ක් (අටවැනි පාර්ලිමේන්තුවේ සිට මේ දක්වා) ඉදිරිපත් කිරීමට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට හැකි වී තිබේ.

- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ තොරතුරු කළමනාකරණ පද්ධතිය භාවිතා කර සියලුම රාජ්‍ය ආයතන වාර්ෂිකව විමර්ශනය කිරීමට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට හැකි වී ඇත. වැය කළ හැකි කාලය සීමා වීම නිසා සාම්ප්‍රදායික ක්‍රමවේදය වන කාරක සභාව ඉදිරියට කැඳවීම මඟින් සියලු රාජ්‍ය ආයතන වාර්ෂිකව විමර්ශනයට ලක් කිරීමට නොහැකි වීමට මෙය සාර්ථක විසඳුමක් විය.

  එසේම,කොවිඩ් සමයේදී ද මෙම ඇගයීම අඛණ්ඩව සිදු කළ හැකි වීම මෙම මාර්ගගත ඇගයිම් පද්ධතියේ ඇති වටිනාකම සහ වැදගත්කම දැක්වෙන සුවිශේෂී අවස්ථාවක් විය.

- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පරිගණක තොරතුරු කළමනාකරණ පද්ධතිය දියත් කිරීමට පෙර එය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා

ප්‍රධානීන් සහ පළාත් පාලන ප්‍රධානීන් ඇතුළු රාජ්‍ය නිලධාරීන් සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වැඩමුළු කිහිපයක් සංවිධාන කළේය.

- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ තොරතුරු කළමනාකරණ පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමෙන් පසු රාජ්‍ය ආයතනවල මූල්‍ය විනයෙහි සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි.
  උදා:- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් විමර්ශනය කෙරුණු රාජ්‍ය ආයතනවල සමස්ත මූල්‍ය පාලනය සහ කාර්යසාධන මාර්ගෝපදේශවලට අනුකූල වීම වර්ධනය වීමේ ප්‍රතිශතය පහත පරිදි වේ.

  2015 ගිණුම් වර්ෂය - 64%
  2016 ගිණුම් වර්ෂය - 71%
  2017 ගිණුම් වර්ෂය - 80%
  2018 ගිණුම් වර්ෂය -78%
  2019 ගිණුම් වර්ෂය - 82%
  2020 ගිණුම් වර්ෂය -80%

**ප්‍රගතීන් පිළිබඳ විශේෂ නිරීක්ෂණ**

2015 වසරේදී 840 ක් පමණ වූ සියලුම රාජ්‍ය ආයතන අතරින් මූල්‍ය හා මෙහෙයුම් කාර්ය සාධනය සඳහා ලකුණු 50 ට අඩු කාර්ය සාධනයක් පෙන්වූ රාජ්‍ය ආයතන සංඛ්‍යාව 111 ක් වූ අතර, එය 2021 වසර වන විට එක් ආයතනයකට පමණක් සීමා කිරීමට හැකි විය.

2015 වසරේදී 90% ට වඩා වැඩියෙන් ඇගයුම් ලකුණු ලබා ගත් ආයතන 58ක්, එනම් 7% ක ප්‍රතිශතයක් පෙන් වූ ආයතන සංඛ්‍යාව, 2021 වසර වන විට ආයතන 329 ක් ,එනම් 37.1 % ක් දක්වා ඉහළ මට්ටමකට ළඟා වී ඇත.

පසු කාලයේදි එනම් 2018 ගිණුම් වර්ෂයේ සිට ආරම්භ කළ නව කාර්ය සාධන ඇගයීම් ක්‍රමයේදි 2021 වසරේදී ආයතන 191 ක්, එනම් 18.3% ක ප්‍රමාණයක් ලකුණු 90 කට වැඩි කාර්ය සාධන මට්ටමක් පෙන්වීම ද ඉදිරි කාලයේදී කාර්ය සාධක දර්ශක වඩ වඩාත් ශක්තිමත් කළ යුතු බවට දිරි ගන්වන්නකි.

- වඩාත් ඵලදායී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික පද්ධති උපයෝගී කර ගනිමින් රජයේ ආදායම් එක්රැස් කිරීම වර්ධනය කිරීම සඳහා එම ක්‍රියාවලියට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්වකරුවන් වන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුව ඇතුළු රාජ්‍ය ආයතන 17ක් විසින් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශ කිරීමට විශේෂ අනු කාරක සභාවක් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පත් කරන ලදී.

  එම අනු කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය ලේකම්ගේ සභාපතිත්වයෙන් හා අනෙකුත් ආදායම් උපදවන අදාළ ආයතන 13 ක සහභාගිත්වයෙන් මූලික තාක්ෂණික කමිටුවක් පත් කරනු ලැබ එය සාර්ථක ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී. ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, තාක්ෂණ අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය මෙම කමිටුවේ සෙසු සාමාජිකයෝ වෙති.

- රටේ ප්‍රධානතම ආදායම් උත්පාදක ආයතන වන ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව මඟින් එක්රැස් කරන ආදායම්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පද්ධති උපයෝගී කර ගෙන ඉහළ නැංවීමෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය වර්ධනය කළ යුතු බවට කාරක සභාව ලබා දුන් නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරුණු එහි වාර්තාවට ද ඇතුළත් විය.

- 2023 වසරේදී, විශේෂ විගණන වාර්තා 48ක් සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශ ඔස්සේ වාර්තා කැඳවා ඇත. මෙම විශේෂ විගණන වාර්තා සලකා බැලීම සඳහා අමාත්‍යාංශ මට්ටමින් කමිටුවක් පත් කිරීමට උපදෙස් ලබා දී අදාළ කමිටුවේ වාර්තාව කාරක සභාව වෙත කැඳවා ඇත. මෙම වාර්තා ද ඉදිරියේ දී විමර්ශනය කිරීමට නියමිතය.

  මාර්ගගත ප්‍රශ්නාවලිය සමාලෝචනයකට ලක් කර කාලීන වශයෙන් වැදගත් සංශෝධන ඉදිරිපත් කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට රැස්වීම් වාර ගණනාවක් මෙන්ම Zoom තාක්ෂණය ඔස්සේ රැස්වීම් මාලාවක් ද පැවැත්වීණි. ඒ අනුව යාවත්කාලීන කරන ලද ප්‍රශ්නාවලි මගින් 2022 වර්ෂයේ ඇගයීම සඳහා තොරතුරු කැඳවා ඇත.

- අනවශ්‍ය තොරතුරු ද ඇතුළත් වාර්ෂික කාර්ය සාධන වාර්තා පිළියෙල කිරීම සඳහා රාජ්‍ය ආයතන විශාල මුදලක් වැය කරන බවට කාරක සභාව නිරීක්ෂණය කර ඇති බැවින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ උපදෙස් මත රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව සකස් කළ පොදු ආකෘතියට අනුකූලව තම වාර්ෂික කාර්යසාධන වාර්තා පිළියෙල කරන ලෙසට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව 2020.01.30 නිකුත් කළ චක්‍රලේඛයක් මගින් සියලු රාජ්‍ය ආයතනවලට උපදෙස් දී තිබේ.

- **රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝග ක්‍රියාත්මක කිරීම**

  පාර්ලිමේන්තුවේ සංශෝධිත ස්ථාවර නියෝග 119 (4) මගින් කාරක සභා නිර්දේශ, ක්‍රියාවට නැංවීම පෙරට පහතින් දක්වා ඇති අයුරින් පෙරට වඩා ශක්තිමත් කර ඇත.

  **(ස්ථාවර නියෝග 119(4)-*"පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ යම් වාර්තාවක් මුදල් විෂය භාර අමාත්‍යවරයාට සහ ආයතන භාර අමාත්‍යවරයන්ට යොමු කරනු ලැබිය යුතු අතර, එවිට, මුදල් විෂය භාර අමාත්‍යවරයා සහ ආයතන භාර අමාත්‍යවරයන් විසින් ඒ සම්බන්ධයෙන් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද <u>පියවර සති අටක්</u> ඇතුළත දී, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු වීම.***

  ***එම නිරීක්ෂණ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම හෝ එම නිර්දේශ සම්පූර්ණ කළ නොහැකි බව අමාත්‍යවරයාගේ අදහස නම්, රාජ්‍ය මුදල් නිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ ගත යුතු විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ ලිඛිතව හේතු පැහැදිලි කළ යුතු වීම***

  ***කාරක සභාවට අවශ්‍ය වන්නේ නම් අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට ආරාධනාවක් කළ හැකි වීම***<br>
  ***එවැනි කාරණා වලින් පැන නගින ප්‍රශ්න වලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුතු බව***

  ***පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී, එකී වාර්තාව නීතිපතිවරයාගේ නිරීක්ෂණ සහ අවශ්‍ය කටයුතු සඳහා යොමු කරනු ලැබිය හැකි වීම***

- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මගින් ඉදිරිපත් කළ වාර්තා සම්බන්ධයෙන් ***මුදල් විෂය භාර අමාත්යවරයා සහ ආයතන භාර අමාත්‍යවරයන් විසින්*** පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ට අනුව ***සභාගත කළ*** නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ උදෙසා ඔහු වෙත යොමු කිරීමේ නව ක්‍රමවේදයක් 8 වැනි පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් හඳුන්වා දෙනු ලැබිණි. එමගින් කාරක සභාවේ පසු විපරම් ක්‍රියාවලිය ශක්තිමත් කෙරිණ.

- 9 වැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභා වාරයේ සිට සූම් තාක්ෂණය (Zoom Technology) ඔස්සේ ඇතැම් විමර්ශන කටයුතු සිදු කිරීම ඇරඹුණි. මෙයට උදාහරණ ලෙස ඌව පළාත් සභාව, නැගෙනහිර පළාත් සභාව සහ සබරගමුව පළාත් සභාව විමර්ශන කටයුතු සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට කැඳවන ලද අවස්ථාවේ දී එම පළාත් සභා යටතේ පැවති ආයතන සියල්ලම සූම් තාක්ෂණය (Zoom

Technology) ඔස්සේ සම්බන්ධ කර ගනිමින් එම ආයතන සම්බන්ධයෙන් පැවති වැදගත් විගණන ගැටළු පිළිබඳව ද ප්‍රශ්න කරන ලදී.

- තවද, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම්වල විමර්ශන කටයුතු සඳහා වැදගත් වන දුරස්ථ ආයතනවල නිලධාරීන් ද සූම් තාක්ෂණය (Zoom Technology) ඔස්සේ කාරක සභා රැස්වීම් වලට සහභාගී කර ගැනීම සිදු කරනු ලබයි.(උදා: පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කෙරෙන විට පළාත් පරිවාස කොමසාරිස්වරුන් ඇතුළු වෙනත් ආයතනවල අදාළ නිලධාරීන් මෙසේ සම්බන්ධ කරගනු ලැබිණි.)

- පාර්ලිමේන්තු වෙබ් අඩවියේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ රැස්වීම් කාල සටහන කැඳවනු ලබන ආයතන ද සමගින් පළ කිරීමට ගත් තීරණයෙන් පසු රාජ්‍ය ආයතන පිළිබඳ තම අදහස්, ගැටළු සහ යෝජනා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ විද්‍යුත් තැපැල, ෆැක්ස් හෝ තැපැල් මගින් යොමු කිරීමට මහජනතාවට අවස්ථාව සලසා දී තිබේ.

- කාරක සභා රැස්වීම් මාධ්‍ය වෙත නිරාවරණය කිරීම

  අට වැනි පාර්ලිමේන්තුවේදී, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා විසින් පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා වෙත ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාවකට අනුව කාරක සභා රැස්වීම් සජීවී ලෙස විකාශය කිරීමට පහසුකම් සැලසිණි ඒ අනුව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 14 මගින් ඒ සඳහා විධිවිධාන සලසා ඇත.

- මෙම නව ක්‍රියාමාර්ග සමඟ විනිවිදභාවය පවත්වා ගැනීමටත් පළාත් පාලන ආයතන ඇතුළු සියලු රාජ්‍ය ආයතන හා පාර්ලිමේන්තුව අතර පවත්නා පරතරය අවම කිරීමටත් කාරක සභාවට හැකි වී තිබේ. රාජ්‍ය ප්‍රතිපත්තිවල අත්‍යවශ්‍ය අංගයක් වන රජයේ මූල්‍ය කටයුතු සාර්ථකව පවත්වා ගෙන යාමට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ මනා ක්‍රියාකාරීත්වය බෙහෙවින් උපකාරී වේ.